# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.05.19 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1018 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**</u>

**01. කුෂ් මත්ද්‍රව්‍ය සමඟ විදේශීය ජාතිකයෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ගුවන්තොටුපල ඒකකය.**

2025.05.19 වන අද දින අළුයම් කාලයේදී කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පයර්න්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බැංකොක් සිට මෙරටට රැගෙන එන ලද **කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 07 ග්‍රෑම් 910ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 21 ක් වන තායිලන්ත ජාතිකයෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමශර්න කාර්යාංශය.**

2025.05.18 වන දින සවස් කාලයේදී මරදාන පොලිස් වසමේ ප්‍රියදශර්න මාවත ප්‍රදේශයේදී කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමශර්න කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 620 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරදාන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමග සැකකාරියක් අත්අඩංගුවට - වේයන්ගොඩ පොලිස් ස්ථානය.**

2025.05.18 වන දින සවස් කාලයේදී වේයන්ගොඩ පොලිස් වසමේ මාරපොල ප්‍රදේශයේදී වේයන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරුවෙකු පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කර පලාගොස් ඇත.

**සැකකාරිය වයස අවුරුදු 18 ක් වන වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පලාගිය සැකකරු විසින් කඩුවකින් පහරදීම හේතුවෙන් නිලධාරීන් දෙදෙනෙකු තුවාල ලබා ඇති අතර එම සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා වේයන්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2025.05.18 වන දින උදෑසන හා දහවල් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ රෂ්ටම් වත්ත හා බඩෝවිට ප්‍රදේශවලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 02ක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 500 ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 500ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 25 හා 33 වයස්වල පසුවන රත්මලාන හා ගල්කිස්ස ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. රිපීටර් වගර්යේ ගිනි අවියක් අත්අඩංගුවට - නාගොඩ පොලිස් ස්ථානය.

2025.05.18 වන දින සවස් කාලයේදී නාගොඩ පොලිස් වසමේ තල්ගස්වල ඇල්පිටිය වතුයාය ප්‍රදේශයේදී නාගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත එම වතුයායේ කසළ ගොඩක සඟවා තිබූ රිපීටර් වගර්යේ ගිනි අවියක් පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා නාගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - හික්කඩුව පොලිස් වසම.

2025.05.18 වන  දින සවස් කාලයේ හික්කඩුව පොලිස් වසමේ හික්කඩුව මුහුදු තීරයේ දිය නෑමට ගිය පුද්ගලයෙකු දිය වැලකට හසුව අතුරුදන් වී ඇති බවට හික්කඩුව පොලිසියට ලද පණිවිඩයක් මත හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ නිලධාරීන් විසින් අතුරුදහන්වූ පුද්ගලයා සොයා සෝදිසි මෙහෙයුමක් දියත් කර ඇත. එහිදී අතුරුදහන් වූ පුද්ගලයාගේ මෘත ශරීරය ඊයේ දින රාත්‍රියේ වැවල වෙරළ තිරයට ගොඩගසා තිබියදී සොයාගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වන නොවෙර් ජාතිකයෙකි.**

මරණකරු  සිය සහෝදරයා සමග හික්කඩුව මුහුදු තීරයේ දිය නාමින් සිටියදී මෙසේ අනතුරට පත්ව ඇත. හික්කඩුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - අත්තනගල්ල පොලිස් වසම.

2025.05.18 වන දින සවස් කාලයේ අත්තනගල්ල පොලිස් වසමේ අත්තනගල්ල අලවල මාගර්යේදී අත්තනගල්ල දෙස සිට අලවල දෙසට ධාවනය වු යතුරු පැදියක් ත්‍රීරෝද රථයකට ඉස්සර කිරීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකාරිය වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පසුපැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 25 ක් වූ ගලපිටමඩ  ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අත්තනගල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - පිලියන්දල පොලිස් වසම.

2025.05.18 වන දින සවස් කාලයේ පිලියන්දල පොලිස් වසමේ මඩපාත පිලියන්දල මාගර්යේ මඩපාත ප්‍රදේශයේදී මඩපාත දෙස සිට පිලියන්දල දෙසට ධාවනය වු යතුරු පැදියක් දකුණුපස අතුරු මාගර්යකට හැරවීමට යාමේදී ඊට පිටුපසින් ගමන් කල යතුරුපැදියක් හැරවීමට ගිය යතුරුපැදියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු පිලියන්දල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත. අනතුරට ලක්වූ අනෙක් යතුරුපැදියේ පැදිකරුද තුවාල ලබා වේරහැර හමුදා රෝහලේ ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පිලියන්දල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පිලියන්දල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**